# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

LIBRARY NEWS

நூலகச் செய்தி

1980 ● පළමුවැනි කාණ්ඩය ● අංක 3 Volume. 1 No 3 1980



**අපේ නව ලිපිනය:**

අධ්‍යක්ෂ,
ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල,
නිදහස් මාවත.
කොළඹ 7.


## පාසල් 9,100 - පුස්තකාල 1,400

# පාසල් පුස්තකාල දියුණුවට පියවර

නුපුහුණු පාසල් පුස්තකාලයාධිපතිවරුන් පුහුණු කිරීම අධ්‍යාපන සේවා අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසු ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය අනුග්‍රහයෙන් මුල පුරන ලද ප්‍රථම කටයුත්ත යැයිද, දැනට තම අමාත්‍යාංශය යටතේ පාසල් නවදහස් එකසිය තිහකට වැඩි ප්‍රමාණයක් ඇතද, ඉන් පුස්තකාල සහිත පාසල් ඇත්තේ එකදහස් හාරසියයක් පමණක් වීම මෙම පාඨ මාලාව සංවිධානය කිරීමට හේතු වූ බවද, අධ්‍යාපන සේවා අමාත්‍ය ගරු ලයනල් ජයතිලක මහතා අමාත්‍යවරයා මෙම පාඨ මාලාව සංවිධානය කිරීම සම්බන්ධයෙන් පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එච්. පී. සිරිවර්ධන මහතාට විශේෂයෙන් ස්තුති කළ යුතු යැයිද, තමා විසින් මේ පාඨ මාලාව සංවිධානය පැවරූ අවස්ථාවේ පටන් සිරිවර්ධන මහතා පුදුම ඕනෑකමකින් යුතුව කටයුතු කළේ යැයිද ප්‍රකාශ කළේය. දිවයිනේ පුස්තකාල ක්‍රමය ව්‍යාප්ත කිරීමටත්, එය අංග සම්පූර්ණ අන්දමින් ඉටු කිරීමටත් බොහෝ සෑම වෙහෙසක්ම ගන්නා බව වුවද උපරිම අන්දමින් ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ව්‍යාපෘති සංවිධානය කිරීම බවද පළ කළේය. අරමුදල් වල සීමිතකමද ඇමතිවරයා අවධාරණය කළේය.

ශ්‍රී ලංකාවේ අකුරු කියවීමේ හැකියාව ඇති පිරිසගේ සංඛ්‍යාව සියයට අසූඅට දක්වා ඉහළ ගොස් ඇතත්, පොත පත කියවීමෙන් බහුශ්‍රැත භාවය ලබා ගන්නා පිරිස ඉතා මඳ බවද ඇමතිවරයා විසින් පෙන්වා දෙන ලදී.

මිනිසුන් පොතපත කියවිය යුතුය. මොනවා හෝ කියවීම

## පුස්තකාල සංවර්ධනයට ආසියා පදනමෙන් ආධාර

ශ්‍රී ලංකාවේ පුස්තකාල සංවර්ධන කටයුතු සඳහා ආසියා පදනම විසින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට රුපියල් එක්ලක්ෂ පනස්දහසක මුදල් ආධාරයක් ලබා දී ඇත.

පුස්තකාල සේවා මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජිත වැඩ සටහනකින් 1979 දී කරන ලද මණ්ඩලීය සමීක්ෂණයකදී ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවට සලසා ඇති කියවීමේ හා තොරතුරු ලබා ගැනීමේ පහසුකම් කෙසේත්ම ප්‍රමාණවත් නොවන බව පෙන්වා දී තිබේ.

මුළු ජනගහණයෙන් 90% ක ප්‍රමාණය ග්‍රාමීයව වෙසෙන නමුදු, කොළඹ හා තදාසන්න නගරවල ජනතාවට සලසා ඇති පුස්තකාල පහසුකම් හා සසඳන විට ග්‍රාමීය ජන කොටස්වලට එකී පහසුකම් සලසා ඇත්තේ මඳ ප්‍රමාණයකින් බව හෙළිවී තිබේ.

පුස්තකාල සේවා මණ්ඩලය විසින් දිස්ත්‍රික් පුස්තකාල සංවර්ධන යෝජනා ක්‍රමයක් යෝජනා කර ඇති අතර, මේ යටතේ එකිනෙක දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ පුස්තකාලය බැගින් ඇති කොට එම දිස්ත්‍රික් පුස්තකාලයෙන් කුඩා පුස්තකාල පෝෂණය කිරීමට යෝජිතව ඇත.

මෙසේ තෝරා ගනු ලබන එකිනෙක දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ පුස්තකාලයන් උදෙසා පුස්තකාල සේවා මණ්ඩලයෙන් ආධාර කරනු ලබන අතර, එම වැඩ පිළිවෙල යටතේ සුදුසු කියවීම් හා මගින් පුස්තකාල සම්පත් වර්ධනය, මූලික ප්‍රමිතීන්ට අනුකූලව ලී බඩු සහ උපකරණ සපයා ලීම මෙන්ම, නුපුහුණු පුස්තකාලයාධිපතීන් පුහුණුවද ඇතුළත් වේ.

පුස්තකාල සේවා මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මෙම යෝජිත වැඩ සටහන ආසියා පදනමේ ආධාර ඉල්වූ ඒ ගණයේ උසස් වැඩ සටහනක් වශයෙන් හැඳින්විය හැකි යයිද, එබන්දකට හැම ආකාරයකින්ම ආධාරෝපකාර කළ යුතුව ඇතැයිද මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළ ආසියා පදනමේ ප්‍රකාශකයකු පැවසීය.

මෙම යෝජිත වැඩ සටහන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මගින්ද අනුමත කර ඇත.



● නව පියවරකට මුල පිරුන වගයි

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවති ගුරු පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ පාඨ මාලාව විවෘත කිරීමේ අවස්ථාව: පිළිවෙලින් වමේ සිට දකුණට පුස්තකාල මණ්ඩලයේ සභාපති එච්. පී. සිරිවර්ධන මහතා, උප කුලපති මහාචාර්ය ලෙස්ලි පණ්ඩිතරත්න මහතා සහ අධ්‍යාපන සේවා අමාත්‍ය ගරු ලයනල් ජයතිලක මහතා, දෙවන ඡායාරූපය අමාත්‍යතුමා රැස්වීම අමතන ආකාරය, තෙවන ඡායාරූපය පාඨ මාලාවට සහභාගි වූ පිරිසෙන් කොටසක්.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා ශාලාවේදී පැවති තත් පාඨ මාලාව ආරම්භ කිරීමේ උත්සවයේදී ප්‍රකාශ කළේය.

මෙම පාඨ මාලාව ආරම්භ කිරීමේ උත්සවයේ මූලසුන පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එච්. පී. සිරිවර්ධන මහතා විසින් උසුලන්නට යෙදිණි.

වැඩිදුරටත් කථා කළ ප්‍රකට කරුණක් බවද ඇමතිතුමා සඳහන් කළේය.

දිවයිනේ පාසල් සංඛ්‍යාව හා පාසල් පුස්තකාල සංඛ්‍යාව අතර ඇති පරතරය බෙහෙවින් බේදජනක බව පළ කළ අමාත්‍යවරයා මේ තත්වය නැති කිරීම වසරකින් දෙකකින් කළ නොහැකි කාර්යයක් බවද, මෙම පාඨ මාලාවේ අරමුණ දැනට පවත්නා සීමිත පාසල් පුස්තකාල සංඛ්‍යාව වැදගත්ය. කියවන්න පොත් කෝ කියා සමහරු ප්‍රශ්න කරනවා. අද පොතපත සඳහා යන නිෂ්පාදන වියදම වැඩි බව පිළි ගන්නා බැව් දැක් වූ අමාත්‍යවරයා එහෙත් හැම් අතින්ම පොත් සුලභ කිරීමට කිනම් බාධක මධ්‍යයේ වුවද ක්‍රියා කිරීමේ වැදගත්කම දක්වා සිටියේය.

මෙහිදී පුස්තකාලය පොත පත පාඨකයා වෙත පැමිණවීමේදී ඉතාම වැදගත් කාර්ය භාරයක් දරණ බවද අමාත්‍යවරයා ප්‍රකාශ කළේය.

පාසල් පුස්තකාල වැඩි දියුණුවට තමාට ලබාදිය හැකි හැම අනුග්‍රහයක්ම ලබාදෙන බව පැවසූ ජයතිලක මහතා, සීමිත මුදල් හා පහසුකම


(2 වැනි පිටුවට)


## පුස්තකාලයාධිපතීන් උසස් කිරීමේ පරිපාටියක්

**වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද අනුව පළාත් පාලන සේවා පුස්තකාලයාධිපතීන් උසස් කිරීමේ යෝජිත ක්‍රමයක් ජාතික පුස්තකාල සේවාමණ්ඩලය විසින් පළාත්පාලන සේවා අධ්‍යක්ෂ වරයාට භාර දී ඇත.**

# අපේ පුස්තකාලය

## දෙහිවල - ගල්කිස්ස මහජන පුස්තකාල ප්‍රණාලිය

දෙහිවල-ගල්කිස්ස ලංකාවේ පළාත් පාලන ආයතන අතුරින් දෙවන වැදගත් පළාත් පාලන ආයතනය ලෙස හැඳින්විය හැක. මෙම පළාත් පාලන බල ප්‍රදේශයේ මෑතක් වන තුරු පැවති පුස්තකාල සංවිධානාත්මක වූවක් නොවීය. පුස්තකාල සේවය පැවතුනේ ඉතාමත් නොදියුණු තත්වයකය.

1977 මැයි මස 16 වන දින හිටපු ජනාධිපති විලියම් ගොපල්ලව උතුමාණන් විසින් විවෘත වූ ප්‍රේසර් මාවතේ නව මධ්‍ය පුස්තකාලය මෙම ප්‍රදේශයේ ජනතාවගේ කියවීමේ පහසුකම් ඇති කොට, ප්‍රදේශයේ ඇති පුස්තකාල සේවය විධිමත් කිරීමේ අරමුණින් ආරම්භ වූවකි.

### දෙහිවල-ගල්කිස්ස නාගරික ප්‍රදේශය

ජනගහණය අනුව බලන විට මෙම නාගරිකය ලංකාවේ වැඩි ජනගහණයක් ඇති දෙවන නගරය ලෙස හැඳින්විය හැක. 1921 දී මෙම ප්‍රදේශයේ ජනගහණය 25,341 ක් වූ අතර, 1974 දී ජනගහණය 1, 62,000 ක් විය. ප්‍රදේශයේ ජනගහණය වැඩිවීමේ සීඝ්‍රතාවය මේ අනුව පැහැදිලිවේ. එමෙන්ම මෙම ජනගහණය සිංහල, දෙමල, මුස්ලිම්, බර්ගර් හා මැලේ ආදී විවිධ ජන කොටස්වලින් සංයුක්ත වන බවද සැලකිය යුතුය.

මෙම නාගරික ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය වර්ග සැතපුම් 6½ ක් පමණ වේ.

### නව මධ්‍ය පුස්තකාලය

මධ්‍ය පුස්තකාලයක් පිහිටුවීමේදී අනෙකුත් ශාඛාවන්ට බාධාවක් නොවන පරිදි කටයුතු කළ අතර, එකද ශාඛා පුස්තකාලයක්වත් වසා තැබීමට කටයුතු නොකරන ලදී.

සාමාන්‍යයෙන් අළුතින් පිහිටුවන විශාල පුස්තකාලයක මූලික ග්‍රන්ථ එකතුව සඳහා පැරණි පුස්තකාලයක ග්‍රන්ථ සම්භාරය ගනී. උදහරණයක් වශයෙන් කොළඹ මහජන පුස්තකාලයේ ආරම්භයද එසේ විය. දෙහිවල මධ්‍ය පුස්තකාලය සඳහා එවැනි පොත් සමූහයක් නොතිබී අතර, තම උත්සාහයෙන්ම ග්‍රන්ථ සම්භාරය දියුණු කිරීමට සිදුවිය.

නමුත් මෙහි ඇති වැදගත් කරුණ වූයේ අද්‍යතන පාඨකයනට අළුත් පොත පත ලබා දීමේ ඉඩකඩ ඇතිවීමය.

### කියවීම් ශාලාව

මෙම අංශයෙහි මුඛ්‍ය පරමාර්ථය වනුයේ පාඨකයනට පුවත්පත් සඟරා සැපයීමෙන් කියවීමේ පහසුකම් සැලසීමයි.

සිංහල, දෙමල හා ඉංග්‍රීසි වශයෙන් පුවත්පත් විසිපහක පමණ සංඛ්‍යාවක් පාඨකයන් සඳහා සපයනු ලබන අතර, එකවර පාඨකයන් 75 කට පමණ ප්‍රයෝජන ගත හැකිය.

මෙහි වර්ග ප්‍රමාණය වර්ග අඩි 810 ක් වේ.

මෙයට අමතරව දැනට මෙම අංශයෙහි ශිෂ්‍යයන්ට අධ්‍යයන කටයුතු සඳහාද පහසුකම් සලසා ඇත.

### ළමා අංශය

මෙහි එකවර ළමුන් 30 කට පමණ කියවීම් පහසුකම් සලසා ඇත. දැනට ලියා පදිංචි වී ඇති ළමා පාඨකයින් සංඛ්‍යාව 434 ක් පමණ වේ.

### වාර සඟරා අංශය

මෙම ශාලාවේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 702 කි. මෙම අංශයෙහි එකවර පාඨකයන් 75 කට පමණ කියවීමේ පහසුකම් සලසා ඇත. විවිධ වාර සඟරා 80 ක් පාඨකයන්ගේ විමර්ශනය සඳහා තැන්පත් කොට ඇත.

### බැහැර දෙන අංශය

මෙහි වර්ග ප්‍රමාණය වර්ග අඩි 1,620 ක් පමණ වේ. මෙහි ලියා පදිංචි සාමාජික සංඛ්‍යාව 2,234 ක් ඉක්මවා ඇත.

### විමර්ශන අංශය හා ශ්‍රී ලංකා අංශය

පුස්තකාලයේ ජනප්‍රිය අංශයක් ලෙස මෙම අංශය හැඳින්විය හැක.

මෙම අංශයෙහි එකවර පාඨකයන් 75 කට පමණ ප්‍රයෝජන ගත හැක. මෙය වර්ග අඩි 810 ක විශාලත්වයකින් යුක්තය.

මෙම අංශයෙහි ශ්‍රී ලංකා ප්‍රකාශන සඳහා වෙනම කොටසක් ඇත.

දෙහිවල ගල්කිස්ස ප්‍රදේශයට අදාල ග්‍රන්ථ, ලියවිලි, පුස්තිකා ආදිය හැකි තරම් දුරට එක් රැස් කර විශේෂ පාඨක සේවයක් සැපයීමට උත්සාහ දරේ.

### මධ්‍ය පුස්තකාල කාර්ය මණ්ඩලය

ප්‍රධාන පුස්තකාලයාධිපති හා සහකාර පුස්තකාලයාධිපතිවරුන් සතර දෙනෙකුගෙන් මෙහි වෘත්තීය කාර්ය මණ්ඩලය සමන්විත වන අතර, පුස්තකාල සහායකයින් ඇතුළුව සුළු සේවකයින්ද සමග මුළු කාර්ය මණ්ඩලය 22 දෙනෙකුගෙන් සමන්විත වෙයි.

### ශාඛා පුස්තකාල හා කියවීමේ ශාලා

අත්තිඩිය හා ගල්කිස්ස යන ස්ථානවල ශාඛා පුස්තකාල දෙකකින්ද, කරගම්පිටිය ධර්මපාල මාවතේ ඇස්. ද ඇස්, ජයසිංහ කියවීම් ශාලාවෙන්ද මෙම අංශ සමන්විත වේ.

### මධ්‍ය පුස්තකාල සඳහා ආධාර

විවිධාකාර ආයතන හා පුද්ගලයින්ගෙන් රු.48,000/ක මුදලක් රැස් කර ගැනීමට පුස්තකාලය සමත් වූ අතර, මෙම පුස්තකාලයේ අරමුදල් තර කර ගැනීමේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මඟින් සලසා ඇත්තා වූ බදු සහන ක්‍රමය යටතේ එය සලසා ගන්නා ලදී.

පුස්තකාල සේවා මණ්ඩලයේ රූපර්ලි පොත් ආධාර ක්‍රමය යටතේද අගනා පොත් පරිත්‍යාගයක් කර ඇත.

(මෙම ලිපිය සකස් කිරීමේදී පුස්තකාල ප්‍රවෘත්ති සඟරාවට (5 වන කලාපය-අංක 4) හිටපු පුස්තකාලයාධිපති ඇම්. ඩී. එච්. ජයවර්ධන මහතා සැපයූ ලිපිය බෙහෙවින් උපකාරී වූ බව සඳහන් කළ යුතුය. වර්තමාන පුස්තකාලයාධිපති කේ. ඩී. එස්. එම්. සෙනෙවිරත්න මහත්මිය මෙහි නිවරද්‍ය භාවය පරීක්‍ෂා කළ බව කෘතඥතා පූර්වකව සඳහන් කළ මනාය.)

● සැකැස්ම: පියසේන වික්‍රමගේ

## ● පුස්තකාල ගොඩනැගිලි විශේෂඥයා යළි පැමිණේ

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය ඉදි කිරීමේ දෙවන අදියරේ කටයුතු සඳහා උපදෙස් ලබා දීමට ලබන වසරේ මුල භාගයේදී පුස්තකාල ගොඩනැගිලි පිළිබඳ යුනෙස්කෝ විශේෂඥ මයිකල් බ්‍රොන් මහතා ස්ථිර වශයෙන් පැමිණෙන බව වාර්තා වෙයි.

දැනට ඉදිවෙමින් පවත්නා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල සැලසුම් කළ මයිකල් බ්‍රොන් මහතා, එම ගොඩනැගිල්ල ඉදි කිරීමේ ප්‍රගතිය පරීක්‍ෂා කිරීමටද නියමිත අතර, ඉදි කිරීමේ කටයුතුවලදී පැන නැග ඇති ගැටළු ඇතොත් ඒවාද නිරාකරණය කිරීමට කටයුතු කරනු ඇත. විශේෂයෙන් දැනට පැන නැගී ඇති ගැටළු සම්බන්ධව ගොඩනැගිලි අධ්‍යක්‍ෂවරයා කෙළින්ම ඔහු හා සාකච්ඡා කරනු ඇතැයි අපේක්‍ෂා කෙරේ.

## විසිවන සියවසේ සංස්කෘතික කෞතුකාගාරයක් නිදන් ගතවේ!

1970 වර්ෂය වන විට මිනිසා ලබා ඇති විද්‍යාත්මක හා සංස්කෘතික ප්‍රගතියේ ලක්‍ෂණ විදහා පාන කාර්මික නිෂ්පාදන, සාහිත්‍යය, කලා, නා නා විධ උපකරණ, ඇඳුම් පැළඳුම්, පොත්පත්, ලිපි ලේඛන යනාදියෙහි ආකෘතීන් සහිත මංජුසාවන් දෙකක් ජපානයේ පොළොව යට මෑතදී නිදන් කරනු ලැබිය.

අවුරුදු පන්දහසකට පසු මෙම මංජුසාවන් නැවතත් පොළොව මතුපිටට ගෙන මනුෂ්‍ය ශිෂ්ඨාචාරය වෙනස්වූ අන්දම හැදෑරීම පිණිස මෙම වස්තූන් උපයෝගී කර ගැනීම මෙම නිදන්ගත කෞතුකාගාරයේ පරමාර්ථය වේ.

1970 දී මිනිසාගේ සංස්කෘතික දියුණුව අමුතුම මගක් ගැනීමට හේතු වූ නොයෙක් සොයා ගැනීම් නිසා, ශිෂ්ඨාචාරයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස මෙම වර්ෂය සමාජ විද්‍යාඥයින් විසින් හඳුන්වා ඇත.

මින් පසු මිනිසාගේ ඉදිරි ගමන මීට ඉහත කාලය හා සසඳන විට සම්පූර්ණයෙන් වෙනස් වනු ඇතැයි ඔව්හු විශ්වාස කරති.

(තවත් 5 පළවේ.)

න වික්‍රමගේ

# ළමා මනස සහ පොත පත

## කියවීමේ පුරුද්දක් ඇති කිරීම

3

ගුරුවරයා පොතපත කියවන්නෙක් නම්, ශිෂ්‍යයා තුළද එම පුරුද්ද ඇති කළ හැකි බව මම මුලදී සඳහන් කළෙමි. මෙය පැහැදිලි කිරීම වස්, බී. ජී. රල්ෆ්ගේ පහත සඳහන් අදහස් සඳහන් කිරීම වටී:

''ගුරුවරයා තමා උගන්වන විටදී නිතර-නිතර පතපොත ගැන සඳහන් කළ යුතුය. ඒ පොත්වල ඇති දර්ශණය හා චරිතද සඳහන් කළ යුතුය. එම පොත්වල ඇති රසවත්, එමෙන්ම ප්‍රිය උපදවන සිදුවීම් විස්තර කළ යුතුය. එවිට ළමයා තුළ ඉබේම කියවීමේ රුචිය ඇති වෙයි. ළමයාට පොත පතින් ලබා ගත හැකි තෘප්තිය පිළිබඳ කියවීමට යොමු කළ හැක. එමෙන්ම ළමයා තමා කියවන දෙය සීමා කළ යුතුය. හරයක් හෝ අරමුණක් නැතිව කියවීමේ පුරුද්ද ඇති විය හැක. එහෙත් පාසලේදී තමා කියවිය යුතු විෂයයන් තෝරා ගැනීමට ගුරුවරයාගේ සහාය ලැබී ඇත්නම්, පොදු පුස්තකාලයේ දීද එම ක්‍රමය අනුගමනය කරයි.



ළමයාට පොතපතින් ලබාගත හැකි තෘප්තිය

උනන්දු කිරීම, පොත් තෝරා ගැනීමේ නිදහස පිළිබඳව ස්ටැන්ලි ජායට මෙසේ කියයි:

''ජනතාවගේ සදචාරයේදී, දේශපාලන ක්ෂෙත්‍රයේදී, වෙනත් කටයුතුවලදී ඉදුරා පහර දීම අසාර්ථක වනු ඇත. තමා රුචි දේ තෝරා ගැනීමේ නිදහස මම නිතරම අගය කළෙමි. කියවීමේ පුරුද්ද ඇති ළමයෙක් අගනා පොතක් වැඩිහිටියකුගේ බල කිරීම නිසා කියවනවාට වඩා, සාමාන්‍ය පොතක් කියවීම අගය කළ යුතුය.''

ළමුන්ගේ කියවීමේ රුචිය වැඩි කිරීමට පරිසරය ඉතා වැදගත්ය. නිවසේ ඇති තරම් පොතපත ඇත්නම් එයට වඩා උනන්දු කිරීමක් තවත් නැත. නමුත් එවැනි තත්වයක් අප රටෙහි බලාපොරොත්තු විය නොහැක. එනිසා පාසලේ, පුස්තකාලයේ, සමාජ ශාලාවේ පන්සලේ - පල්ලියේ පොත පත කියවීමේ පරිසරය ඇති කිරීම වැදගත්ය. පතපොත බහුලව ඇති නිවසෙහි දරුවන් තුළ කියවීමේ රුචිය වඩාත් පවතින බව පෙනී යාමෙන් ඉහත සඳහන් කරුණු සනාථ වෙයි. ළමුන්ගේ කියවීමේ රුචිය වර්ධනය වන තවත් ක්‍රම සලකා බලමු.

### ස්වෝත්සාහයෙන් කියවීම:

ස්වෝත්සාහයෙන් කියවීමේ රුචියක් ඇති ළමුන් සඳහා පොතපත පිළිබඳ විවාද, ශබ්ද නගා කියවීම, කතාන්තර කියැවීම, සාමූහික කියැවීම යනාදිය පිළිබඳව පුහුණුවක් දිය යුතුය. තවද නිශ්ශබ්දව කියවීමේ අවස්ථා ඇති කර දිය යුතුය.

තමා කියවන පොතපත පිළිබඳව ළමයා කරන ප්‍රචාරය ඉතා වැදගත්ය. තමන් සතු පොත් හා පුස්තකාල පොත් මිතුරන් අතර බෙද හැර, ඔවුන් තුළ පොතපත කියවීමේ වර්ධනය කිරීමද කළ යුතුය. සාහිත්‍යමය පොත් හඳුන්වා දිය යුතුය.

ගුරුවරයාගේ උනන්දුව ගැන මේ වනතුරු කරුණු සඳහන් කළෙමි. පාසල් පුස්තකාල හා ඒවායේ ඇති පතපොත ගැන සමහර සත්‍ය කරුණු සඳහන් කිරීමද වැදගත් යයි සිතමි. මෙහි ආරම්භයේදීම ශිෂ්‍යයන් කියවන්නේ කුමන අදහසින්දැයි සඳහන් කළෙමි.

පාසල් කියවීම් ශාලාවකට තිබිය යුතු [|සුදුසුකම් පහත සඳහන් කරමි:

1. පන්ති කාමර නීතිරීති අහෝසි කර, ස්වාධීනව කටයුතු කිරීමට නිදහස දී කියවීමේ උනන්දුව වඩවා ලීම.
2. ගුරුවරයාගේ මැදිහත් වීමක් නොවැතිව, ස්වෝත්සාහයෙන් දැනීම වර්ධනය කර ගැනීම.
3. ළමුන් සමාජ සම්බන්ධතාවන්ට සුදුසු පුද්ගලයින් කරවීම.

මේ අදහස් මූලික ලෙස සලකා, සේවය කරන ගුරුවරු, කතුවරු, ශිෂ්‍යයින් උනන්දු කරවීමට අවශ්‍ය මාර්ග තීරණය කර ගත යුතුය. උදාහරණ වශයෙන් භූගෝල විද්‍යා පාඩමේ අප්‍රිකාව ගැන ඉගෙන ගන්නා විට ඒ රටේ කතා, ගවේෂණ තොරතුරු තත්ත්ව යන් ගැන උගැන්මට ශිෂ්‍යයන් තුළ තම කැමැත්ත ඇති කිරීමේ හැකියාව කර්තෘවරුන්ට ඇත. මෑතකදී සිදුවූ සඳ තරණය ශිෂ්‍යයන් අතර ඇති කළ උනන්දුව අපි දනිමු. පරිසරයටත්, අවස්ථාවටත් උචිත පුවත් ඇතුළත් කතා සම්බන්ධ කිරීමෙන් කියැවීමේ රුචිය වර්ධනය කළ හැකිය යන්න අප සිහියේ තබා ගත යුතුය.

● එස්. එම් කමල්දීන්

---

# පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස්

## පුස්තකාල සම්පත්

3

පුස්තකාලයට අවශ්‍ය වන පොතපතින් කොටසක් පාසලේ උගන්වන විෂයයන්ට අදාල විය යුතුයි. තවත් කොටසක් ක්‍රීඩා, විනෝද කටයුතු වැනි බාහිර කටයුතු වලට අදල විය යුතුය. තුන් වැනිව, ශිෂ්‍යයන්ගේ මානසික සංවර්ධනයට නොහොත් කල්පනා කිරීමේ ශක්තිය දියුණු කරලීමට උපකාරි වන පොත්පත් සම්පාදනය කිරීම අවශ්‍යයි.

පාසල් පුස්තකාලයට පොත් ලබා ගැනීමේදී මෙම අවශ්‍යතාවයන්ට ගැලපෙන පොත්පත් තෝරා ගැනීමට වග බලා ගත යුතුයි. එමෙන්ම පුස්තකාල කෙරෙහි වැඩි උනන්දුවක් නොදක්වන ...ෂ්‍යයන් පොතපතට නැඹුරු ... ද්‍රව්‍ය ලබා ගැනීමට අමතක නොකළ යුතුය.

### පොත්පත් තෝරා ගැනීම:

පොත් තේරීමේදී න්‍යායක් වශයෙන් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තියක් ඇත; එනම්: පොතක් පුස්තකාලයක තැන්පත් කළ යුත්තේ එම පොතින් ප්‍රයෝජනවත් දැනුම ලබා ගත හැකි විය යුතුය- එසේ නැතිනම් එය කියවීමෙන් යම්කිසි වින්දනයක් ලැබිය යුතුය යන දෙකින් එකක් පදනම් කරගෙනය. පුස්තකාලයේ හිස් බව නැති කිරීම සඳහා පොත් රාක්ක පිරවීම අර්ථ විරහිතය. එයින් සිදුවන්නේ වටිනා ඉඩකඩ ඇහිරීම හා ශ්‍රමය අපතේ යැවීම පමණය. අනවශ්‍ය පොත්පත් අතරේ හොඳ පොතපතක් තිබුණත් එය සොයා ගැනීමටද නොහැකි වේ.

පුස්තකාලය ප්‍රයෝජනවත් තැනක්ය යන හැඟීම ශිෂ්‍යයන්ගේ සිතින් ගිලිහී යෑමටද එය හේතුවේ. හොඳ පොත්පත් ටිකක් ඇති පුස්තකාලය, වැඩකට නැති යල් පැන ගිය පොත්පත් දහසක් ඇති පොත්ගුලකට වඩා ප්‍රයෝජනවත් බව මෙනෙහි කළ යුතුය.

### ශ්‍රව්‍ය-දෘෂ්‍ය පාඨක ද්‍රව්‍ය

සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ගුවන් විදුලිය, කැසට්, රූපවාහිනිය, ග්‍රැම පෝන් තැටි, චිත්‍රපට, චක්‍ර, සිතියම් යනාදී ඇසට හා කණට ගෝචර වන ද්‍රව්‍ය ඉගැන්වීමේ කටයුතුවලට ඉතා යෝග්‍යය. පාසල්වල ඉගැන්වෙන සෑම විෂයයකටම පාහේ මෙම මාධ්‍යයන් යොද ගැනීමෙන් ශිෂ්‍යයිනට අධ්‍යාපනික තොරතුරු ආයාසයක් නොමැතිව ඉගෙන ගැනීමට මහ සැලැස්විය හැකිය.

ඇතැම් විෂයයන් ඉගැන්වීම සඳහා පොත්පත්වලට වඩා චිත්‍රපට හෝ රූපවාහිනීය හෝ එවැනි මාධ්‍යයන් වඩා යොග්‍යද වේ.

විශේෂයෙන්ම භූගෝලය වැනි විෂයයන් පොතින් ඉගෙන ගැනීමට වඩා දැක බලා ගැනීමෙන් ක්ෂණිකව අවබෝධ කර ගත හැක.

සංගීතය ඉගැන්වීමේදී ශබ්ද මාධ්‍යය අවශ්‍යමය. ඇතැම් කරුණු පැහැදිලි කිරීමට ශබ්ද මාධ්‍යය හෝ දෘෂ්‍ය මාධ්‍යය පොත්පත්වලට වඩා බෙහෙවින් ප්‍රයෝජනවත්ය.

එම ද්‍රව්‍ය වරකට එක් කෙනකුට වඩා බොහෝ සංඛ්‍යාවකට සාමූහිකව පරිභෝජනය කළ හැකි හෙයින් පන්තිවලට ඉගැන්වීම සඳහා ඉතා කාර්යක්ෂම මෙවලම වන්නේය.

පුස්තකාලවල ආරම්භයේ සිටම මෙම ද්‍රව්‍ය රැස් කර භාවිතයට ගැනීමට පහසුකම් සැලැස්වීම පුස්තකාලසේවයේ කාර්යක්ෂමභාවය තහවුරු කෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ පුස්තකාල හා ශ්‍රව්‍ය-දෘෂ්‍ය එක් අංශයක් යටතේ පිහිටුවා ඇත්තේ මෙම ආකල්පය යටතේ හෙයින්, පුස්තකාල සංවිධානයේදී මෙම ආකල්පය ක්‍රියාත්මක කිරීමට පාසල් ප්‍රධානීන් උත්සුකවීම මැනවි.

● විශේෂ ලියුම්කරුවකු විසිනි

# ජාතික පුස්තකාලයෙන්

## ● මෙයින් අවුරුදු 5,000 ක් ගියද නිධානයක සාක්ෂියට (වදුළු) පොතක්

''අද දිනයෙහි වෙසෙන ලෝක වාසීන්ගෙන්, අනාගත ලෝක වාසීනට තිළිණයක්...'' මේ වැකිය එන්නේ නොබෝද ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයට ජපන් රටින් පරිත්‍යාග කැරුණු ''The Official Record of Time Capsule Expo '70 නමැති මාහැඟි ග්‍රන්ථයේ.

එමෙන් මේ ග්‍රන්ථයෙන් ප්‍රකාශයට පත් කර ඇත්තේ පිටපත් දෙදහසක් පමණයි. ඉතාම රමණීය නිමාවක් සහිත මේ ග්‍රන්ථය ලොව පුරා ජාතික පුස්තකාල අතරත පමණක් නොබෝද බෙදු හරිනු ලැබුවේ විශේෂ හේතුවක්ද ඇතිවයි.

1970 වර්ෂය වන විට මිනිසා ලබා ඇති විද්‍යාත්මක හා සංස්කෘතික' ප්‍රගතියේ ලක්ෂණ විදහා පාන කාර්මික නිෂ්පාදන, සාහිත්‍ය-කලා, නානාවිධ උපභෝග පරිභෝග භාණ්ඩ, පොත්පත් හා ලිපි ලේඛන යන ආදියෙහි ආකෘතීන් රැගත් කාල මංජුසාවක් (Time Capsule) ජපානයේ පොළව යට මේ නොබෝද නිදන් කරනු ලැබුවා.

මේ නිදන් කිරීම ගැන ලොව පුරා සාක්ෂ්‍ය එළවනු පිණිසයි ඒ සම්බන්ධිත කාල මංජුසාව පිළිබඳ සියළු තොරතුරු රැගත් ග්‍රන්ථයලොව හැම රටකම ජාතික පුස්තකාලවල තැන්පත් කරනු ලැබුවේ.

කාලමංජුසා වැඩ සටහන කුමක්ද කියා විමසා බැලීම මෙහිදී උචිතයි.

1970 දී මිනිසාගේ සංස්කෘතික දියුණුව අමුතුම මගක් ගැනීමට හේතු වූ නොයෙක් සොයා ගැනීම් නිසා මිනිස් ශිෂ්ඨාචාරයේ වැදගත් සන්ධිස්ථානයක් ලෙස මෙම වර්ෂය විද්‍යාඥයින් විසින් හඳුන්වා ඇත.

මින්පසු මිනිසාගේ ඉදිරි ගමන මීට ඉහත කාලය හා සසඳන විට සම්පූර්ණයෙන් වෙනස් වනු ඇතැයි ඔවුහු අපේක්ෂා කරති.

●

1967 මැයි මසදී සුප්‍රකට එක්ස්පෝ '70 ජාත්‍යන්තර ප්‍රදර්ශණය සඳහා කටයුතු පිළියෙල වෙමින් තිබියදී ජපානයේ'මයිනිචි'(MAINICHI) පුවත්පත් මගින් කාල මංජුසා නිදන් කිරීම පිළිබඳ සංකල්පය මුල් වරට ඉස්මතු කරන ලදී.

මයිනිචි පුවත්පත් මේ පිළිබඳ සංකල්පය වැඩිදුරටත් සලකා බලමින් සිටියදී, ස්වකීය අයතනයේ 50 වන සංවත්සරය 1968 වර්ෂයේදී කොයි ආකාරයෙන් සිහිපත් කළ යුතුද යන්න ගැන මත්සුසිතා (Matsusitha) විදුලි කාර්මික සමාගමද සෙවිල්ලෙන් සිටියා.

එක වර්ගයේ කුරුල්ලෝ එකට එක්වනවා සේ මයිනිචි පුවත්පත් මත්සුසිතා සමාගමට කාල මංජුසා වැඩ සටහනට එක්වන ලෙස ඇරයුම් කළා.

> ශ්‍රී ලංකා ජාතික පුස්තකාල ගොඩනැගිල්ල දැනට කොළඹ තුරඟ තරඟ පිටියේ පස් මහල් ප්‍රාසාදයක් සේ ඉදිවෙමින් පවතී. ජාතික පුස්තකාලය 1982 දී විවෘත කිරීමට නියමිත අතර, ඒ සඳහා පොතපත රැස් කිරීම ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් දැන් අරඹා ඇත. ජාතික පුස්තකාලයෙන් නමැති මෙම විශේෂාංගයෙන් අරමුණු කරනුයේ එසේ එම ජාතික පුස්තකාලයට ඒකරාශි වන සුවිශේෂ ග්‍රන්ථ ගැන තොරතුරු බිඳක් පාඨකයා වෙත ගෙන ඒමයි.

1967 දෙසැම්බර් මස වන විට මේ පිළිබඳ ගිවිසුමට දෙපක්ෂය එකඟ වුනා.

නිල වශයෙන් එක්ස්පෝ '70 කාල මංජුසා වැඩ වැඩ සටහන 1968 ජනවාරි මස අටවනද නිල වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී.




● කාල මංජුසාව

කාල මංජුසා වූකලී අද දිනයෙහි වෙසෙන ලෝක වාසීන්ගේ වර්තමානය පිළිබඳ වාර්තාවක් අනාගත ලෝකයාට තැබීමේ අටියෙන් බෙහෙවින් සිතා මතා ඇති කරන ලද සංකල්පනාවක පලයයි. එය අප වෙසෙන යුගය විදහා පාන සාධක රැසක්.

නූතන මිනිසා අතීතය පිළිබඳ බොහෝ දේ හාරං පාරා ගවේෂණය කර ඇත්තේ පුරා විද්‍යඥයින්ගේ හා ඉතිහාසඥයින්ගේ අනුසාරයෙනි. වර්තමානය ඔහුට ප්‍රත්‍යක්ෂයකි.

කාල මංජුසාව වූ කලී, මෙම දියුණු වර්තමාන යුගය පිළිබඳ විද්‍යාමාන සාධක ඉදිරි මිනිසාට ඉවහල් වන පරිද්දෙන් සංරක්ෂණය කිරීමේ ප්‍රයත්නයක්.

විශේෂයෙන් විද්‍යානුකූල ගවේෂණයන් සඳහා සංරක්ෂණයක්.

●

මේ සඳහා ප්‍රමුඛ ජපන් විද්‍යාඥයින් හා උගතුන්ගෙන් සමන්විත 23 දෙනෙකුගෙන් යුතු පිරිසක්ද, 27 දෙනෙකුගෙන් සමන්විත විද්‍යා, සමාජ අධ්‍යයන සහ කලාවන් පිළිබඳ විශේෂඥයන්ගේ තේරීම් කමිටුවක්ද පත්කරන ලදී.

1968 පෙබරවාරි මස 28 වන දින වනවිට (හරියටම කාල මංජුසා වැඩ සටහන ප්‍රකාශයට පත් කර මාස දෙකකට පසු) මූලික සැලැස්ම පිළියෙල කිරිමට මේ පිරිස සමත් වුනා. ඔවුන් ප්‍රධාන වර්ග තුනකින් කාල මංජුසාවේ භාණ්ඩ වර්ග දැක්වූහ:

1. සමකාලීන ශිෂ්ඨාචාරයේ වාර්තා අතීත උරුමයද ඇතුළුවන පරිද්දෙන්
2. ජපානයේ පුරාණ සහ නූතන වාර්තා විශේෂ වශයෙන්
3. සමකාලීන ජීවිතයේ නියෝජනාත්මක භාණ්ඩ

මෙය පහසුව තකා ස්වභාව විද්‍යා, සමාජ විද්‍යා හා කලා වශයෙන් තවත් තුන් ආකාරයකින් වර්ග කරන ලදී.

මෙහි අන්තර්ගත විය යුතු භාණ්ඩ ආදර්ශයන් වශයෙන් තිබිය යුතු බවටද නිර්දේශ කැරිණ.

ඒ අනුව, අවසාන තේරීමෙදී විවිධ වර්ගවල ද්‍රව්‍ය 2,068 ක් අඩංගු කිරීම සඳහා අනුමත විණි. ඉන් 759 ක් විවිධ වර්ගවල භාණ්ඩ වූ අතර, ඉතිරි 1,309 ටේප්, චිත්‍රපට, තැටි ආදිය විය.

මෙම ද්‍රව්‍ය කාල මංජුසාවේ අඩංගු කිරීම කෙසේ කළ යුතුද යන්න හා ඒවායේ ආදර්ශ ඊට අදාලව කවාකාරයෙන් සකස් කළ යුතුද යන්න සම්බන්ධව වසර දෙකක් තිස්සේ සොයා බලා කටයුතු සැකසිණ.

ජපන් ජනයා මෙහි අඩංගු කිරීමට යෝජනා කළ ද්‍රව්‍ය අතර පැවැත්ම පිළිබඳ අවදානම් සහිත සිවුපාවුන් සහ කුරුළන්ගේ හඬපට හා චිත්‍රපට, මිනිස් කෙහෙ රැළි, මිනිස් දත්, විදුරු ඇස්, මේස ලුණු, මදුරුවෙක් සහ මැස්සෙක්, පොහොර, කෘෂි රසායන, තැපැල් පතක්, නව අවුරුදු ආසිරි පතක්, විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාග ප්‍රශ්න පත්‍රයක්, ගමන් බලපත්‍රයක්, යෙන්, 1,000 බැංකු නෝට්ටු, ලොතරැයි ටිකට් පතක්, මාංචු කට්ටලයක්, උපත් සහ විවාහ ලියාපදිංචි පෝරම, ජපන් කොඩිය, ජපන් වස්ත්‍රවල ආදර්ශ, විවිධ වෘත්තිවල ආදයම් චක්‍රයක්, වැඩිම ආදයම් ලබන සිය දෙනා, සංගීත ප්‍රසංගයක්, සම්භාව්‍ය සංගීතය, ලෝකයේ හරස් කඩක ඡායාරූපයක් සහ ලෝකයේ විවිධ රටවල ළමයින්ගේ චිත්‍ර ආදියද වෙයි.

මෙහිදී දැක්විය යුතු විශේෂ කරුණ නම් ලෝකයේ විවිධ රටවල ළමයින්ගේ චිත්‍ර අතරත ශ්‍රී ලංකාවේ දැරියක වන එල්. එම්. මණිමෙඛලා ද සිල්වා (වයස 15) ගේ 'ගොඩනැගිල්ලක්' නමැති චිත්‍රයද ඇතුළත්ව තිබීමයි.

●

අන්තර්ගත කළ යුතු ද්‍රව්‍ය අතරට චිත්‍රපටද ඇතුළත් විය යුතු බව 1969 දී තීරණය කරන්නට යෙදුණි.

මෙසේ අඩංගු කිරීමට තෝරා ගත් චිත්‍රපට අතර ආසියාතිකයන් වන අපට බෙහෙවින් සමීප සම්භාව්‍ය සිනමාකරුවෙකු වන ඉන්දියාවේ සත්‍යජිත් රායිගේ පතෙර් පංචලි චිත්‍රපටයද වෙයි.

ජපන් චිත්‍රපට අතුරින්ද හොඳම චිත්‍රපට 10 තෝරා ගන්නා ලද අතර, ඒ අතරත ලංකාවේද ප්‍රදර්ශිත අකිර කුරසාවාගේ රශෝමොන් චිත්‍රපටයද, ඕසුගේ හා ඉචිකවාගේ චිත්‍රපටද වේ.

මේ සඳහා තෝරා ගැනුන වෙනත් හොඳම චිත්‍රපට අතර පෝලන්තයේ අන්දෝ වයිදාගේ පැපියොල් අයිඩයමන්ට්, රුසියාවේ සර්ජි අයිසෙන්ස්ටයින්ගේ පොටෙම්ප්කින්, එංගලන්තයේ චාලි චැප්ලින්ගේ ගෝල්ඩ රෂ්, ප්‍රංශයේ ඇලන් රෙනේ හා ඉතාලියේ රොබෙටෝ රොසලිනි, එංගලන්තයේ කැරෝල් රීඩ් ආදීන්ගේ චිත්‍රපටද වෙයි.

සම්භව්‍ය ජපන් සාහිත්‍යයෙන් තෝරා ගැනුන සාහිත්‍ය කෘති අතර ශ්‍රී ලංකාවටද හැඳිනීමක් ඇති නත්සුමේ සෝසෙකි, නොබෙල් ත්‍යාගලාභී යසුනරි කවබතා ආදීන්ගේ කෘතිද වෙයි.

විදේශීය සම්භව්‍ය සාහිත්‍යයෙන් විලියම් ශේක්ස්පියර්, ක්‍රිස්ටියන් ඇන්ඩර්සන්, රබෙලා, පුෂ්කින්, වර්ජිනිජ් ආදීන්ගේ කෘතිවල ජපන් පරිවර්තනද වෙයි.

කෙසේ වුවත් මින් අවධාරණය වන කරුණක් නම් ජපන් රට ආශ්‍රිත බොහෝ දේ සඳහා ප්‍රමුඛත්වය දී තෝරා ගෙන ඇති බවයි.

අපට මෙසේ පෙනී ගියත්, කාල මංජුසාවේ අන්තර්ගත කරන ද්‍රව්‍ය සම්බන්ධයෙන් බෙහෙවින් සූක්ෂමව ක්‍රියා කර ඇති බැව් වටහා ගැනීම් අසීරු නැත. මෙබඳු තත්ව ඇතිවීම එනිසා ස්වාභාවිකය.

●

ජපානයට පොදුවූ පරමානු බෝම්බයේ අත්දැකීමද එහි අඩංගු කිරිමට ඔවුනට අමතක වී නැත. පරමාණු බෝම්බය දැම්මේ විපාක වශයෙන් තුන් අවුරුද්දකට වතාවක් ගිලිහෙන නිය පොත්තක් සහිත මිනිසකුගෙන් එසේ ගිලිහෙන නිය පොත්තක්ද අඩංගු කර ඇත්තේ සාමයේ පණිවිඩයක්ද වශයෙන් සලකාය.

මෙවැනි ද අඩංගු කළ කාල මංජුසාව ඔසාකාහි කාසල් උද්‍යානයේදී නිදන් ගත කිරීම සඳහා තෝරා ගැනුනේ විශේෂ සලකා බැලීමකින් පසුවයි. මෙය මූලිකව රජයේ භූමි භාගයකි. එමෙන් සංස්කෘතික කටයුතු පිළිබඳ ඒජන්සිය මගින් නඩත්තු වන්නකි.

නිදන් කිරීමේ කාර්යය ඇරඹුනේ 1970 ඔක්තෝබර් මස පළමුවනදයි. 1971 ජනවාරි 28 වන ද දෙවන මංජුසාව පළමුවන මංජුසාව මතුමත්තේ නිදන් කරන ලදී.

මේ මංජුසාවේ ආදර්ශයක් ඔසාකා නුවර කෞතුකාගාරයේ තැන්පත් කරන ලද්දේ ඒ සඳහා විශේෂයෙන් පිහිට වූ කාමරයකය. එහි ජනෙල් කවුළු තුළින් මංජුසා නිදන් කළ බිම පැහැදිලිව පෙනෙන බව දැක්වේ.

මේ ග්‍රන්ථයේ ඉහතින් දැක්වූ කරුණුවලට අමතරව මංජුසාව ගොඩ ගන්නා ආකාරය ගැනද කරුණු දක්වා ඇත. එහි ආකෘතියේ සැලැස්මක්ද මීට අඩංගුය.

ග්‍රන්ථ සූචියේ අඩංගු දෑවල ලේඛනය විස්තර වශයෙන් දැක්වෙයි.

මෙවන් සුවිශේෂ කරුණක් ගැන සුවිශේෂ වූ මේ ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලද්දේ 1975 මාර්තු මසදීය.

මෙයින් අවුරුදු පන්දහසක් ගිය තැන (ඒ කියන්නේ ක්‍රි. ව. 5670) මෙසේ නිදන් කරන ලද පළමුවන කාල මංජුසාව විවෘත කිරීමට නියමිත අතර, දෙවන කාල මංජුසාව කාලානුරූපව (එය පළමුවරට විවෘත කිරීමට නියමිත ක්‍රි. ව. 2000 දීයි) විවෘත කර, ඒ වන විට සංරක්ෂණය පිළිබඳ නවතම ශිල්ප විධි හා තාක්ෂණික ක්‍රම උපයෝගී කර නැවත ඒ භාණ්ඩ සකසා යළි යළිත් නිදන් කරීමට කටයුතු යොද ඇත. ඉන්පසු වසර සියයකට වරක් මෙලෙසින්ම කටයුතු කිරීමට සැලසුම් කර ඇත.

● පියසේන වික්‍රමගේ

